Lanka e News

# ආයතන 8 ක දූෂණය කෝටි 2000 යි - ශිරාල් ලක්තිලක

(ලංකා ඊ නිව්ස් -2008, නොවැ. 26. ප.ව. 2.30) ලංකා විදුලිබල මණ්ඩලය, ක්‍රිකට් පාලක මණ්ඩලය, මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන 8 ක රුපියල් කෝටි 2000 කට ආසන්න බරපතල දූෂණ අක්‍රමිකතා සිදුව තිබෙන බවට 'දූෂණ විමසුම' ට තොරතුරු ලැබී ඇතැයි එහි ක්‍රියාකාරිකයකු වන නීතිඥ ශිරාල් ලක්තිලක මහතා පවසයි.

කොළඹ දී ඊයේ (25) පැවැති මාධ්‍ය හමුවකදී ඔහු මේ අනාවරණය කළේය.

දූෂණ අක්‍රමිකතා සිදුව තිබෙන අනෙක් ආයතන ලෙස ඔහු නම් කළේ ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වැට් බදු වංචාව, වරාය අධිකාරිය, ජාතිය ගොඩ නැගීමේ අමාත්‍යංශය, සෞඛ්‍ය අමාත්‍යංශය හා ප්‍රීමා ආයතනයයි.
මේ රටේ ජනතාව සිවිල් යුද්ධයකට හා ආර්ථික යුද්ධයකට මුහුණ දී සිටින අතර, දූෂණ වංචා හේතුකොට ගෙන ආර්ථික යුද්ධයට බරපතල ලෙසම මුහුණ දෙන්නට සිදුව තිබෙන බව පැවසු ලක්තිලක මහතා රුපියල් කෝටි 320 ක මුදල් විනාශයක් කළ 'මිහින් එයාර්' ගුවන් සමාගම දූෂණ වංචා කළ එක් ආයතනයක් ලෙස හැඳින්විය. පසුගිය 8 වනදා වනවිට වරාය හා ගුවන් සේවා අමාත්‍යංශය වීරවිල ගුවන් තොටුපල හා මිහින් එයාර් වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 6000 ක් ලබාගෙන නොවැම්බර් මාසයේ ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවක් මගින් බෝයිං 737 ගුවන් යානයක් මිලදී ගැනීම සඳහා රුපියල් කෝටි 110 ක් වෙන් කර ගෙන තිබෙන බවත්, වරාය හා ගුවන් සේවා අමාත්‍යංශය 2008 වැය ශීර්ෂයේ වියදම් නොකළ මුදල් මෙසේ ගුවන් යානයක් මිලදී ගන්නට වෙන් කරගෙන තිබෙන බවත් ලක්තිලක මහතා පැවැසීය. මෙයට අමතරව ගුවන් තොටුපල හා ගුවන් සේවා අධිකාරියෙන් මිහින් එයාර් සමාගම ණයක් ලබා ගැනීමට යන අතර, මහා භාණ්ඩාගාරය මෙම සමාගමෙන් රුපියල්

මිලියන 250 ක කොටස් ලබාගෙන ඇති බවත්, එසේ ලංකා බැංකුවට රුපියල් කෝටි 170 ක් ද, ඛනිජ තෙල් සංස්ථාවට රුපියල් 64 කෝටි 50 ලක්ෂයක් හා ලංකා පුත්‍ර බැංකුවට රුපියල් කෝටි 50 ක් ද මිහින් එයාර් සමාගම ණය තිබියදී එම මුදලට අමතරව රුපියල් කෝටි 110 ක් මෙසේ ලබාගෙන ඇති බවද ලක්තිලක මහතා පෙන්නා දුන්නේය.